කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්
සමාජීය විද්‍යා පීඨය
ආර්ථික විද්‍යාව
(නව නිර්දේශය)

# සූක්ෂම ආර්ථික විද්‍යාව - ECON 28214

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ආ) ආර්ථික විද්‍යාවේ ආරම්භය හා විකාශය, ආර්ථික විද්‍යාව සම්බන්ධ විවිධ අර්ථ දැක්වීම් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

ආ) සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව වශයෙන් ආර්ථික න්‍යාය ප්‍රධාන කොටස් දෙකකට වෙන් කරන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)

ඇ) යථානුරූපී ආර්ථික විද්‍යාව සහ අභිමතානුරූපී ආර්ථික විද්‍යාව උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

02. i. සංඛ්‍යා සූචක උපයෝගිතා ප්‍රවේශය හඳුන්වන්න. (ලකුණු 05)

ii. ආන්තික උපයෝගිතා න්‍යාය තුළ භාවිත වන උපකල්පන විස්තර කරන්න. (ලකුණු 06)

iii. පාරිභෝජක සමතුලිතය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. හීනවන ආන්තික උපයෝගිතා නීතිය ප්‍රස්ථාරයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. "උපේක්ෂා වක්‍රය" ප්‍රස්ථාරිකව නිරූපණය කර, නිර්වචනය කරන්න. (ලකුණු 05)

ii. උපේක්ෂා වක්‍ර විශ්ලේෂණයේ දී භාවිත වන උපකල්පන ආන්තික උපයෝගිතා න්‍යායේ දී භාවිත වන උපකල්පනවලින් වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06)

iii. උපේක්ෂා වක්‍රවල ගතිලක්ෂණ රූප සටහන් ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 04)

iv. පාරිභෝජක සමතුලිතය වෙනස්වීම ආදායම් පරිභෝජක වක්‍රය සහ මිල පරිභෝජක වක්‍රය ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. i. භාණ්ඩයක මිල වෙනස්වීමේ ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක විස්තර කර, මිල වෙනස්වීමේ මුළු ප්‍රතිවිපාකය, ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ප්‍රස්ථාර ඇසුරින් වෙන්කොට දක්වන්න. (ලකුණු 10)

ii. ප්‍රත්‍යක්ෂවරණ න්‍යාය උපේක්ෂා වක්‍ර විග්‍රහයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. i. නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වා, කෙටිකාලීන හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිත රූප සටහන් සහ උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. කෙටිකාලීන සහ දිගුකාලීන පිරිවැය ශ්‍රිතවල මූලික ලක්ෂණ සහ හැඩය රූපසටහන් භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06. අ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක ලක්ෂණ පැහැදිලි කර, එහි කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතය රූප සටහන් මගින් විස්තර කරන්න. (ලකුණු 10)

ආ) පූර්ණ තරඟ වෙළෙඳපොල තත්ත්වය උත්කෘෂ්ඨ වෙළෙඳපොල තත්ත්වයක් වශයෙන් සලකන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. i. ඒකාධිකාරී වෙළෙඳපොලක ලක්ෂණ පැහැදිලි කර එවැනි වෙළෙඳපොල තත්ත්වයක් බිහිවිය හැකි අවස්ථා විස්තර කරන්න. (ලකුණු 10)

ii. ඒකාධිකාරී වෙළෙඳපොලක කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය ප්‍රස්තාර ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

08. i. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොල, කතිපයාධිකාරී වෙළෙඳපොල ආකෘතියෙන් වෙනස් වන්නේ කෙසේදැයි රූපසටහන් භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 12)

ii. ව්‍යාවර්තිත ඉල්ලුම් වක්‍ර විග්‍රහය රූප සටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

*******************************